පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290
ආයතනයේ නම : මහජන ආරක්ෂක අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீடுகளின் தொடர் : 290
நிறுவனத்தின் பெயர் : பொது மக்கள் பாதுகாப்பு அமைச்சு

நிலையியற் கட்டளை இலக்கம் 119(4) யின் அடிப்படையில் பொதுக் கணக்குகள் குழுவால் பாராளுமன்றத்திற்கு வழங்கப்பட்ட அறிக்கை தொடர்பிலான அவதானிப்புகளையும் மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகளையும் சமர்ப்பித்தல்.

Parliamentary Series No: 290
Name of the institution: Ministry of Public Security

Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of the Standing Order No 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 290

ආයතනයේ නම :- මහජන ආරක්ෂක අමාත්‍යාංශය

අනු අං.	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුනාගෙන ඇති අඩුලුහුඩුකම්	අඩුලුහුඩුකම් නිවැරදි කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්වය
1	2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් මෘදුකාංගයට අදාල පලවෙනි මුරපදය ගණකාධිකාරී හෝ වෙනත් අවසර ලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිත කර නොතිබුණි.	අවශ්‍ය පරිදි මුරපද යාවත්කාලීන කර ගණකාධිකාරී (මූල්‍ය) විසින් පමණක් භාවිත කිරීමට කටයුතු කර ඇත.
2	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාර 2018.08.01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අදාළ කාල වකවානුව තුළ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවති අතර අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක වී නොමැත. වර්තමානය වන විට ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබයි.
3	මු.රෙ. 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි.	අදාළ කාල වකවානුව තුළ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවති අතර අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක වී නොමැත. වර්තමානය වන විට ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා මු.රෙ. 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත්කරනු ලබයි.
4	මු.රෙ. 134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අදාළ කාල වකවානුව තුළ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවති අතර අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක වී නොමැත. වර්තමානය වන විට ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා මු.රෙ. 134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත්කරනු ලබයි.
5	විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 2ක් වත් පවත්වා නොතිබුණි.	අදාළ කාල වකවානුව තුළ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවති අතර අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක වී නොමැත. වර්තමානය වන විට ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු පවත්වාගෙන යනු ලබයි.

6	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 1 කොටස 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ඇතුලත මු.රෙ. 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 1 කොටස 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ප්‍රකාරව අමාත්‍යාංශයක/ දෙපාර්තමේන්තුවක/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට අදාලව පළාත් හෝ ප්‍රාදේශීය කාර්යාල පවතී නම් භාණ්ඩ සමීක්ෂණය වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුත්තේ ඉදිරි මුදල් වර්ෂයේ ජුනි 15ට පෙර වන අතර 2021 මූල්‍ය වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්ථාව 2022.06.02 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
7	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌනතා පිළිබඳව වන නිර්දේශද නියමිත කාලවකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌනතා පිළිබඳව කටයුතු අදාල වසර ඇතුලත සිදු කර ඇත.
8	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	ඉදිරියේදී ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරමි.
9	වාහනයක් ගර්හිත වී මාස 8කට වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි.	ගර්හිත වාහන දැනට නොමැත.
10	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වන ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ 2021 මූල්‍ය වර්ෂයේ පැවති අතර අවශ්‍ය ගැලපීම් හා නිරවුල් කිරීම් පසුව සිදු කර ඇත.
11	නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	වෙනත් ආයතන වෙත ප්‍රතිපාදන නියමිත කාලය තුල ලබා දී තිබුනද ඇතැම් හදිසි අවශ්‍යතා වලදී කාල රාමුවෙන් පිටද ප්‍රතිපාදන ලබා දීමට සිදු වන බව දන්වා සිටිමි.
12	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිටි පැවත එන හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා විශේෂ කාර්යය බලකායේ එක් නිලධාරියෙකුට එරෙහිව දිසා අධිකරණයේ නඩු පවරා ඇති අතර, අනෙකුත් නිලධාරීන්ගෙන් ක්‍රමයෙන් අයකර ගනිමින් පවතී.
13	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය 2021 වර්ෂයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබූ අතර 2023 වර්ෂයේ සිට අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ලබා දීමට කටයුතු කර ඇත.
14	අක් මුදල් සැසඳුම් ප්‍රකාශය අනුව අනාවරණය වී තිබුනු වෙනස්කම් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.	අක්මුදල් සැසඳුම් ප්‍රකාශය අනුව වෙනස්කම් නොතිබුණි.
15	2017.09.20 දිනැති 2017 අංක 4 දරණ කලමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුලත කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	මේ වන විට සිදුකරමින් පවතී.

16	මහජනයා විසින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබාදීම/ලබා නොදීම සම්බන්ධව විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි.	මේ වන විට මෙම ලේඛණය පවත්වා ගෙන යනු ලබයි.
17	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	මේ වන විට මෙම ලේඛණය සකස් කොට පවත්වාගෙන යනු ලබයි.
18	පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට සකස් කර ඇත.
19	ආයතනයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	නිසි ක්‍රමවේදයක් සකස් කරමින් පවතී.
20	2018 ජනවාරි 24 දිනැති අංක 02/2028 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මේ වන විට සකස් කර ඇත.
21	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	කාර්ය මණ්ඩලයේ 50%කට වැඩි පිරිසක් සඳහා වසරකට අවම වශයෙන් පැය 12කට නොඅඩු වන පරිදි පුහුණු අවස්ථා ලබා දීමට හැකිවන පරිදි මානව සම්පත් සැලැස්ම යාවත්කාලීන කරන ලදී.
22	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	යාවත්කාලීන කර ඇත.
23	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරයෙකු නම් කර නොතිබුණි.	මේ වන විට නිලධාරියෙකු නම් කර ඇත. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)
24	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	පවතින ප්‍රතිපාදන මත පුහුණු අවස්ථා උපරිම මට්ටමකට ගෙන ඒමට කටයුතු සැලසුම් කර ඇත.
25	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට සියලුම මාණ්ඩලික නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දී ඇති අතර සියල්ල ලයිස්තු ගතකොට ඇත.
26	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන්ගේ තොරතුරු වාර්ෂිකව ඉදිරිපත් කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 290

ආයතනයේ නම :- ශ්‍රී ලංකා පොලිසිය

අ. අං	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුනාගෙන ඇති අඩුලුහුඩුකම්	අඩුලුහුඩුකම් නිවැරදි කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්වය
1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කර නැත.	2021 වර්ෂයේ ශ්‍රී ලංකා පොලිසියේ වාර්ෂික මූලය ප්‍රකාශනයන් 2022.02.24 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. (නියමිත දිනය 2022.02.28 වේ)
2	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	ප්‍රමාදයන් මග හරවා ගෙන ඇති අතර 2021 වර්ෂයේ සියලුම විගණකාධිපති විමසුම් සඳහා පිළිතුරු සපයා ඇත. එසේම 2022 වර්ෂයේ දී විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා ඇත.
3	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	ප්‍රමාදයන් මග හරවා ගැනීමට කටයුතු කර ඇත.
4	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2021 වර්ෂයට අදාළව ශ්‍රී ලංකා පොලිසියට අයත් සියළු ස්ථානවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. 2021 වර්ෂයේ දී භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ දී සිදු වූ ප්‍රමාදයන් මග හරවා ගැනීමට කටයුතු කර 2022 වර්ෂයේ දී භාණ්ඩ සමීක්ෂණය නියමිත දිනට සිදු කර ඇත.
5	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2021 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශයන් ක්‍රියාත්මක කර ඇත.
6	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	2002.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක 01/2002 අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/92 මගින් දක්වා ඇති නිලධාරීන් සඳහා අනුයුක්ත කර ඇති වාහන හැර, අනෙකුත් වාහන සඳහා දෙපාර්තමේන්තු නාමය සටහන් කිරීමට කටයුතු කර ඇත.
7	වාහනයක් ගර්හිත වී මාස 8කට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	2021 සහ 2022 වර්ෂයේ ශ්‍රී ලංකා පොලිසියට අයත් ධාවනයෙන් ඉවත් කරන ලද වාහන අපහරණය කිරීම සඳහා වාහන ගර්හිත කිරීමේ මණ්ඩලය විසින් නිර්දේශ කර මීල තක්සේරු මණ්ඩලය විසින් පරීක්ෂා කර තක්සේරු කිරීමෙන් පසු රජයේ ගැසට් පත්‍රයේ පළ කර, 2023.08.22, 2023.08.29, 2023.09.05, 2023.09.12, 2023.09.14, 2023.09.21, 2023.09.27 යන දිනයන්හි වෙන්දේසි කිරීමට කටයුතු කර ඇත.
8	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	2021.12.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශන වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ හඳුනා ගෙන මේ වන විට නිරවුල් කර ඇත.

9	මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කර ගෙන තිබුණි.	මහජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීම, නීතිය හා සාමය අඛණ්ඩව පවත්වා ගෙන යාම වෙනුවෙන් අත්‍යාවශ්‍ය පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා මු.රෙ.94(1) අනුව ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් ඇති කර ගැනීම සද්භාවයෙන් සිදු කර ඇති අතර එම බැඳීම් ඊළඟ වර්ෂයේ දී නිරවුල් කර ඇත.
10	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2021.12.31 දිනට නිලධාරීන් 2125 දෙනෙකුගෙන් අය විය යුතු හිඟ හිටි ණය ශේෂය රු.46,756,018ක් වූ අතර 2023.09.30 දින වන විට නිලධාරීන් 561 දෙනෙකුගෙන් රු.7,254,305ක් අය කර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි ණය ශේෂයෙන් තව දුරටත් අය කර ගත නොහැකි ණය ශේෂය වන, රු.9,074,954ක් වූ ණය ශේෂ රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 අනුව කපා හැරීම සඳහා ගොනු ඉදිරිපත් කර ඇත. ඒ අනුව තව දුරටත් අය කර ගැනීමට ඇති ණය ශේෂය වන රු.30,426,759ක මුදල අයකර ගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවතී.
11	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2021.12.31 දිනට වසර 02ක කාලය ඉක්මවා තිබූ තැන්පත් ගිණුමේ ශේෂය රු.232,581,722ක් වූ අතර එම තැන්පතු ශේෂයෙන් රු.102,202,315ක මුදලක් 2023.10.31 දින වන විට නිරවුල් කර ඇති අතර එදිනට නිරවුල් කිරීමට ඇති මුදල වන රු.130,379,407 සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කිරීමට ක්‍රියා මාර්ග ගෙන ඇත.
12	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	2021 වර්ෂයේ ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විගණන මතයක් නොවන අතර තත්ත්වාගණනය කළ විගණන මතයකි.
13	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක PSC/EST/05-04-63/01/2022 හා 2022.06.17 දිනැති ලිපිය මගින් අනුමත කර ඇති ශ්‍රී ලංකා පොලිසියේ ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කිරීම සඳහා නිකුත් කර ඇති 2022.09.08 දිනැති අංක 2735/2022 දරණ පොලිස්පති චක්‍රලේඛය මගින් ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන්ගේ ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 290
දෙපාර්තමේන්තුවේ නම :- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

අනු අං.	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුනාගෙන ඇති අඩුලුහුඩුකම්	අඩුලුහුඩුකම් නිවැරදි කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්වය
පළමු කොටස : 81.00		
01	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	2021 වර්ෂය තුල පැවති කොවිඩ් වසංගත තත්ත්වයද පරිගණක වැඩසටහන් සම්බන්ධයෙන් වන තාක්ෂණික කරුණු පිළිබඳ පැහැදිලි කිරීම් ලබාගැනීමේදී දෙපාර්තමේන්තුවේ පැවති කාර්යබහුලත්වය හේතුවෙන් විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීමේ ප්‍රමාදයන් සිදුවුවද මේ වන විට නියමිත කාලයේදී විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීම සිදු කෙරේ.
02	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	
03	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේ මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදයෙහි 2018 වසරේ සිට එක් එක් ආයතනය විසින් මිලදී ගන්නා ලද හා අපහරණය කරන වත්කම් සම්බන්ධයෙන්, කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතු කරුණු සම්බන්ධයෙන් ඉදිරියේදී උපදෙස් නිකුත් කරන බව සඳහන් කර ඇති අතර, ඒ අනුව කොම්ප්ට්‍රෝලර් ජනරාල් විසින් වරින් වර ඉදිරිපත් කරන ලෙස දන්වන ලද තොරතුරු ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. එසේම උක්ත කරුණ සම්බන්ධයෙන්, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාවේ පෙන්වා දී ඇති බැවින් 2022 වසරේ සිට කාර්තු වශයෙන් එම වාර්තාව යැවීමට කටයුතු කර ඇත.
04	සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	දැනට දෙපාර්තමේන්තුව සතුව දෛනිකව ප්‍රවාහනයට එක් කර ඇති වාහන සංඛ්‍යාව 33 කි. ඉන් PH-9562, PH-4517, NC-9317, NC-9321 දරණ රථ 2023.12.18 දින සිට වසර 02 ක කාලයක් සඳහා කල්බදු ලීසිං ක්‍රමය යටතේ ලබා ගෙන ඇත. වාහන 28 ක අයිතිය දෙපාර්තමේන්තුව සතුව පවතින අතර NB-6469 දරණ රථය පවරා ගැනීම සඳහා 2022 ඔක්තෝම්බර් මස සහ 2023.06.23 දිනැති ලිපි මඟින් ලිඛිතව දන්වා ඇති අතර, වාර කිහිපයකදි මුදල් අමාත්‍යාංශය වෙත ගොස් හා දුරකථන මාර්ග ඔස්සේ උත්සහ කලද මෙතෙක් මෙම රථය පවරා දීමේ කාර්යය සිදුවී නොමැත. මේ පිළිබඳව දෙපාර්තමේන්තු විගණන කළමණාකරන කමිටු රැස්වීමේදී වාර 06 ක් සාකච්ජාවට ගෙන ඇත.

05	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව සතු සියලුම වාහන ආගාමික හා විගාමික නිති උල්ලංගණය කරන විදේශිකයන් අත්අඩංගුවට ගැනීම් සහ විමර්ශන කටයුතු සඳහා අවස්ථානුකූලව යොදවන බැවින් මෙම වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රා කිරීම මඟින් එම විමර්ශන කටයුතු සඳහා මහත් ගැටළු එල්ල වේ. විමර්ශන සඳහා දිගින් දිගට එකම වාහනයක් භාවිතා කිරීම ඔත්තුකරුවන් හට වාසි සහගත විය හැකිය.කෙසේ වුවත් මේ වන විට සියලුම වාහන වල දෙපාර්තමේන්තුවේ නාම පුවරුවක් ඉදිරියට පෙනෙන ආකාරයෙන් රථයේ ඉදිරිපස විදුරුව ඇතුලතින් තබා ඇත.
06	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන පරීක්ෂාවන් කර නොතිබුණි.	දෙපාර්තමේන්තු සතු වාහන 06 ක ඉන්ධන දහන පරීක්ෂාව මේ වන විට සිදු කර ඇති අතර දෙපාර්තමේන්තුව සතු සංචිත වාහන රාජකාරී කටයුතු වලට බාධා නොවන ආකාරයෙන් ඉදිරියේදි ඉන්ධන පරීක්ෂාව සඳහා යොමු කිරීමට කටයුතු කරමි.
07	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	අදාළ සියලු ශේෂයන් මේ වන විට නිරවුල් කර ඇත.
08	මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇතිකර ගෙන තිබුණි.	වැය විෂය ප්‍රතිපාදනය ඉක්මවා බැඳීම් වලට එළඹීය නොහැකි බව පිළිගනිමි. එහෙත් 2021 වර්ෂය තුළ ආයතනයේ පාලනයෙන් බැහැර වූ සමාජ තත්ත්වයන් තුල ක්‍රියාත්මක කිරීමට සිදුවූ සුවිශේෂ වැඩසටහන් හේතුවෙන් අනිවාර්යයෙන් සිදුකළ යුතුව තිබූ කාර්යයන් වෙනුවෙන් බැඳීම් සඳහා එළඹීමට සිදුව තිබුණි. දෛනිකව මහජනයා සමග සම්බන්ධ රාජකාරී කරනු ලබන ආයතනයක් වන බැවින් බැහැරලිය නොහැකි කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් විකල්පයක් නොමැති වීම මත මෙලෙස ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීමට හේතුවී ඇත.
09	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	මියගිය අජිත් විජේසූරිය මයාගේ ණය ශේෂය අය කරගැනීම ඇප කරුවන් පිළිබඳව විමසා බැලීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ණය ගොනුව ගෙන්වා ගත් අතර, අග්‍රහාර රක්ෂණය ඇපකරු වශයෙන් ඉදිරිපත් කර ඇත.එය වලංගු නොවන බැවින් හා මෙම ණය මුදල අය කර ගැනීමට වෙනත් ක්‍රමයක්ද නොමැති බැවින් මෙම ණය මුදල කපා හැරීමට ආගමන හා විගමන පාලක ජනරාල්ගේ නිර්දේශය සහිතව මහා භාණ්ඩාගාර අනුමැතියට යැවීමට කටයුතු කර ඇත. වැඩ තහනම් කරන ලද එච්.කේ.ආර්.ඒ. ජයවර්ධන මයා අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වා ඇති අතර, නැතිවී තිබූ ලිපි ගොනුව සම්බන්ධයෙන් දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් කමිටු වාර්තාව කැඳවා තිබූ අතර එය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. විශ්‍රාම වැටුප සැකසීමේදී මෙම මුදල අයකරගත හැකිය. එම්.යූ.එම්. මුනසීර් මයා - සේවයෙන් පහ කිරීම මත රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා මගේ අංක

		DIE/ADM/E7/ආපදා ණය /පොදු හා 2023.09.25 දිනැති ලිපියෙන් එම්.යූ.එම්. මුනසීර් මහතා දැනුවත් කර ඇත. චින්තක ජයමාල් මහතාගේ ණය ශේෂය වෙනුවෙන් මේ වන විට ඇපකරුගෙන් අදාල මුදල අයකර ගැනීමට කටයුතු කර ඇත.
10	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	2021 වර්ෂයේ දී රට තුල පැවති කොවිඩ් වසංගතය තත්ත්වය හේතුවෙන් නිලධාරීන් සීමා කර රාජකාරී වලට කැඳවීම මත ඇතැම් අවස්ථාවල තත්කාර්ය අතුරු අග්‍රිම පියවීම් වල ප්‍රමාදයන් සිදුවී ඇත. දැනට මෙම තත්ත්වය නිවැරදි කර ලබා ගන්නා තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය අවසන් වී මසක් ගතවීමට පෙර නිරවුල් කරනු ලබයි.
දෙවන කොටස : 89.00		
01	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්මමේ හෝ අහිතකර මට්මමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ මතය තත්ත්වාගනනය කළ මතයකි.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 290

දෙපාර්තමේන්තුවේ නම :- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

අනු අං.	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුනාගෙන ඇති අඩුලුහුඩුකම්	අඩුලුහුඩුකම් නිවැරදි කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්වය
පළමු කොටස : 96.00		
1	2017.06.26 දිනැති අංක 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අංක 1/2017 දරණ චක්‍රලේඛයේ වර්ෂය තුල වත්කම් මිලදී ගැනීම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කාර්තුමය වශයෙන් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු බව දන්වා තිබුණද, ඉදිරියේදී ඒ පිළිබඳව උපදෙස් ලබා දෙන බව දන්වා ඇත. ඒ අනුව, වරින්වර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද උපදෙස් අනුව ඉල්ලුම් කරන ලද තොරතුරු නියමිත ආකාරයට ඉදිරිපත් කර ඇත.
2	සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය පිංතාරු කර නොතිබිණි.	මේ වන විට දෙපාර්තමේන්තුව සතු වාහන වල රාජ්‍ය ලාංඡනය සළකුණු කිරීම ආරම්භ කර ඇති අතර 2024.01.31 දින වන විට චක්‍රලේඛය ප්‍රකාරව සළකුණු කල යුතු වාහන වල රාජ්‍ය ලාංඡනය සළකුණු කිරීම අවසන් කරනු ඇත.
3	මු.රේ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබූ ප්‍රතිපාදනයන් උපයොජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි.	මු.රෙ.94(1) අනුව ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් වලට බැඳීම අහුරා තිබුණද, අදාළ වර්ෂය සඳහා සැපයුම් හා සේවා වියදම් වෙනුවෙන් වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අවස්ථා වලදී මු.රෙ. 94(2) යටතේ සලසා ඇති ප්‍රතිපාදන අනුව මෙලෙස බැඳීම් වලට එළඹ ඇත.
දෙවන කොටස : 79.00		
1	සකස් කරන ලද මානව සම්පත් සැළැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි. සැලසුම්ගත පුහුණු අවස්ථා වලින ලබා දී ඇති පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 වර්ෂයේ දිවයින පුරා පැවති කොවිඩ වසංගත තත්ත්වය මත සංචරණයට හා පිරිස් ඒකරාශී කිරීමට සීමා පැනවීම හේතුවෙන් සැළසුම් කල පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වූ බැවින් ප්‍රමාණවත් කාර්ය සාධන මට්ටමක් ළඟා කර ගැනීමට නොහැකි විය. 2022 වර්ෂයේ සිට පුහුණු වැඩසටහන් වල කාර්යයසාධනය ප්‍රමාණවත් මට්ටමක පවත්වා ගත හැකි පරිදි පුහුණු සැළසුම් කිරීමට පියවර ගෙන ඇත.
2	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මිට්ටමේ හෝ අභිතකර මට්ටමේ විය.	විගණකාධිපති විසින් විගණන මතය තත්ත්වාගණනය කර ඇත.

විරාන් අලස්

මහජන ආරක්ෂක අමාත්‍ය